දෙව්ලියන් අමතා, නාරි ලඳුන්ගේ අරුම බලනු පිණිස ඔවුන්ට බිමට වඩින්නැයි කියන සිසිරගේ එක් ගීයක්, තියුණු විවේචක රීතියක් අනුව ලියැවුණකි. දෙව්ලියන්ගේ උවන් පරයන මේ කතුන්ගේ වර්තමානය ළතැවුලින්, පීඩනයෙන් ගහණ වූවකි.

දිව්‍ය විමානේ කැළුම් විහිදන
දිව්‍ය ළඳුන්ගේ උවන පරදන
නාරි ලියන්ගේ අරුම බලන්න
දිව්‍ය ළඳුන්නේ බිමට වඩින්න !

සියොළඟ දියවෙයි කම්හල් යායේ
රූ සිරි විකිණෙයි සල්පිල් ගානේ
සම්මස් බිළිවෙයි රෑ තුන් යාමේ
අතවර බෝමයි යන එන පාරේ

ජනගීයේ හා ජනකවියේ සම්පත් කෙරෙහි ආශක්තව ඒවා සීමා රැස් කරමින් ඉන් නිර්මාණාත්මක 'නව ගීතයක්' නිමවීම වෙනුවෙන්, වෙහෙසෙන සිසිර දිසානායක, අතීත කාව්‍ය ඉක්මවා, වර්තමානයට පා තබන විටත් අත්කර ගන්නා ජයග්‍රහණ රැසකි. ඔහුගේ ගීතයේ ආත්මය ජන සංස්කෘතිය වූව ද, ඔහු එකී පටු පරාසයෙහි ම රඳවා තැබිය යුතු නැත. කාලීන සමාජ අත්දැකීම් නිරූපනය කරනු සඳහා ද ඔහු නිසැකව ම සූදුසු කම් ලබා සිටින්නෙකි.

**රත්න ශ්‍රී විජේසිංහ**
**2005. 07. 03**

## නොදුටු සිහිනයක් !

සිහිනයකින් පවා නොසිතන ඉසව් කරා දෛවය අප රැගෙන යන්නේ කිනම් වූ ආශිර්වාදයකින් ද ? එලෙස මා රැගෙන ගිය එක් ගමන් මඟෙක ස්වර්ණමය මං සලකුණකි "සිසිරගේ කුරුටු ගී".

සිසිර දිසානායක නම් වූ සුහුඹුල් ගේය පද රචකයකු දොරට වඩමවනු ලැබුයේ වික්ටර් රත්නායක නම් වූ මහා ගාන්ධර්වයාණන් විසින් යැයි ලොවට මා හඬ ගා කියන්නේ නිහතමානීව තනිව විඳගන්නා සාඩම්බරයකිනි. සිංහල ගීතයේ මහගෙදර වූ ශ්‍රී ලාංකා ගුවන් විදුලි සංස්ථාවේ සරළ ගී වැඩසටහනක් තුළින් ය, ඒ. ඒ මතු නොව එම රචකයාව නිර්මාණය කරන ලද්දේ ද රත්නායකයන්ගේ නිර්මාණ පෙළහරින් පිබිදුණ රසිකත්වය ම යි. මාගේ එක් උපන් දිනයෙක ම'පියාණන් "කළණ මිතුරෝ" සිනමා පටය නැරඹීමට කැඳවා ගෙන ගියේ මා කුඩා සිසුවකු අවධියේ දී ය. එහි වූ රත්නායකයන්ගේ පසුබිම් ගී හඬින් උන්මත්තකයකු වී පිබිදුණා වූ රසිකත්වයයි මාගේ රචනාවන්ට රතු පළස එලූයේ. නිවසේ ආලින්දයේ බොහෝ රාත්‍රී කාලයන්හිදී පැවැත්වුණු ඒක පුද්ගල ගීත ප්‍රසංගය "කන්දොස්කිරියාවක්" ලෙසින් අත්විඳි පවුලේ උදවිය මේ උන්මාදයට අද ද සාක්ෂි දරත්. ගුවන් ගත වන ගී පද රචනා එක්රැස් කරමින්, ඒවා විමර්ශනය කරමින් ගයන්නට උත්සාහ කළ ඒ කුඩා විය අද මා සිහිකරන්නේ මහත් වූ සොම්නසිනි.

මා තුළ පද පෙළ ගැන්වීමේ යම් හැකියාවක් ඇත්නම් ඒ වෙනුවෙන් මා මුලින්ම සිහිපත් කළ යුතුව ඇත්තේ අවිස්සාවේල්ලේ සීතාවක මහා විද්‍යාලයේ සංගීතාචාර්යවරයකුව සිට අප අතරින් මීට වසර තිස් එකකට පෙර වියෝ වූ දිසානායක ආරච්චිලාගේ ගාමිණී ප්‍රේමතිලක නම් වූ මා දයාබර පියාණන් ය. මැදමහනුවර

ප්‍රදේශයේ ඉපිද, පසු කලෙක මරදාන පංචිකාවත්තේ "සංගීතෝදය" කලායතනයේ කේ. ලයනල් පෙරේරා මාස්ටර්ගෙන් ද, අනතුරුව හේවුඩ් ආයතනයෙන් ද, භාරතයෙන් ද හින්දුස්ථානී රාගධාරී සංගීතය හදාළ එතුමාගේ ගේය පද රචනාවක දෙපදයකි මේ.

"නිදාගන්න දොයි - දොයි
මගේ සුදු පුතා
වඩා ගන්න එයි දෙව්ලොවින්
දේවතා . . . ."

මා මැණියන් මේ ගීයෙන් මා පමණක් නොව මගේ බාලු දෙසොහොයුරියන් ද නැළැ වූ හඬ අද ද මා සවනත නිම්නාද වේ.

පියාණන් විසින් රචනා කරන ලද "මිණි සළඹ" නාට්‍යය රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලයේ වේදිකාවේ සාර්ථක ව රඟ දැක්වුණ අතර, ගුවන් විදුලි විකාශනය සඳහා පටිගත කිරීමට මා ද කැඳවාගෙන ගිය ගමන මාගේ ප්‍රථම ගුවන් විදුලියට ගිය ගමන වීය. නාට්‍ය විනිශ්චය මණ්ඩලවල සාමාජිකයකු වශයෙන් නව රඟහලට යන ගමන්වලදී කුඩා මා ද රැගෙන යාම සිරිතක් වීය, එතුමන්ගේ. මකුලොලුව ලයනල් එදිරිසිංහ, ජයශේකර වැනි මියැසි ඇදුරන්ගේ මුහුණුවර හුරුකරමින් ම'පියාණන් ම'සිතෙහි ඉදිකළ වින්දනයේ පදනම මා මෙතෙක් ආ ගමනේ සවිය විණැයි මම තරයේ ම අදහන්නෙමි.

ජීවිතයේ මා වඩාත් ආදරය කරන, "අ" යන්නෙන් පටන් ගැණෙන වදන් තුනකි. ඒ "අම්මා", "අවිස්සාවේල්ල" සහ "ආනන්දය"යි. මාගේ නිර්මාණ දිවියේ දී ද බොහෝ සම්පත් සැපයූ තෝතැනිය, ඒ. සීතාවක මහා විද්‍යාලයේ ම සිංහල ගුරුවරියකගේ කුසයෙන් සිංහලය මිට මොළොවගෙන උපදින්නට මා වරම් ලැබුයේ කෑගල්ලේ කුරුම්බාපිටියේ කරුණා සාදිමැණිකේ මැණියන්ට පින් සිදුවෙන්නටය. ඇය මාගේ මුල් ම සිංහල ගුරුවරිය වූයේ දෙවැනි ශ්‍රේණියේ මාගේ පන්ති භාර ගුරුවරිය වශවෙනි. දක්ෂ චිත්‍ර ශිල්පයෙකු වූ ඇයගේ සොයුරාගේ හුරුව ලබා දීමට දෝ ඕ තොමෝ පාසැලේ ඉවත ලූ හුණු කැට ගෙනැවිත් දෙමින් මා විසින් ගෙබිම පුරා ඇඳි බලිසිතුවම් රස වින්දාය. මාගේ හපන්කම්වල සිහිවටන රැස් කරමින් වියෝ වූ පියාණන්ගේ වගකීම් ද කරපින්නාගත් ඕ අප තිදෙනෙකු නේරංජනාවෙන් එතෙර කොට අද විශ්‍රාම සුවයෙන් පසුවන්නීය.

අගනුවර උපත ලබා, අධ්‍යාපන හා රැකී රක්ෂා කටයුතු සඳහා ද වැඩි වශයෙන් අගනුවර ම ගැවසීමට සිදුවූවද "මගේ ගම අවිස්සාවේල්ල"යයි නම් කරන්නේ මහත් වූ සෙනෙහසිනි. සීතාවක හා කැළණි නදී නිම්නහන්හි ඇති මනෝරම්‍ය වූ භූමියටත්, අස්වැසි දනන්ටත්, සිරිපා සිරසත්, බැලුම් ගලත් අතරින් නැගෙන හිරු රැස් දෝරින් ලැබුවා වූ කල්පනා ශක්තීන් කෙරෙහිත් වූ ගෞරවයයි ඒ. සීතාවක රාජසිංහ අභිමානයයි ඒ. නගර ආසන්නයේ පිහිටියේ වූ නමුදු කටාරමක සහිත ඓතිහාසික ගල් ලෙන හා අවට ගල් තලාවන්ගෙන් ද, යටත් විජිත යුගයේ ඉදිවුණ දිය රඳනයෙන් ද, එහි වනරක්ෂිතයෙන් ද කඳු වැටි අතරින් ගලා හැලෙන දොල දහරින් ද අලංකෘත පරිසරයක ය මාගේ "විණා ශ්‍රී" නිවහන මා හට සෙවන සැදූයේ. සීතාවක නදී තෙර අති සුන්දර භූමි භාගයක පිහිටි මාගේ මුල් පාසල වූ සීතාවක මහා විද්‍යාලය ද නිවහනේ පරිසරය සේ ම අද ද මාගේ නිර්මාණයන්ට මූලබීජයන් සපයයි. මගේ දිවියට බොහෝ හරයන් ප්‍රේරණය කළා වූ විශ්‍රාමික විදුහල්පතිවරුයකු වන සාර්ලිස් අමරසිරි මහත්මා ය මා හට අකුරු කියැවූයේ. සීතාවක රාජධානිය පිළිබඳ ව විමර්ශනාත්මක ග්‍රන්ථයක් ද එළි දැක් වූ එතුමා දක්ෂ විෂ වෛද්‍යවරයකු ජ්‍යොතිශ් ශාස්ත්‍රඥයකු, ලී කැටයම් ශිල්පියෙකු වශයෙන් අද ද ගැමියන්ගෙන් පිදුම් ලබන්නේ ය. ම පියාණන්ගේ කළණ මිතුරෙකු වූ එතුමා ම'පියාණන් සේම සුදෝ සුදු ජාතික ඇඳුමින් සැරසී මගේ ගම පිළිබඳ වන මනෝ රාජ්‍යයේ නිතර සරන්නේ ය.

දිගු කාලීන පාසල වූ කොළඹ ආනන්ද මහා විද්‍යාලය මාගේ සහජ කුසලතා එළි දැක්වූ තාවල්ල වී ය. මහා කළු සිංහලයකු සේ අපට "සිංහලය" පෙවූ එච්. ජී. ධර්මදාස ඇදුරුතුමන් සහ මගේ සිතුවම් රාමු ගත කර ශාලා බිත්ති සැරසවූ මුණසිංහ ඇඳුරතුමිය පෙරටු කර ගත් සියලුම ගුරු මව්පියන් සිහිකරන්නේ බැතියෙනි. ඇඳීමේ හැකියාව අදවනතුරු නිසි අගැයීමකට ලක් වූයේ විද්‍යාලයීය ත්‍යාග ප්‍රධානෝත්සවයේ දී පමණෙකැයි විටක සිතේ. ශිෂ්‍යභට හේවිසි තූර්ය වාදක කණ්ඩායමම මා බටනලා වාදකයකු කරවී ය. "අනඳ නුවණ" සංගමයේ සංවිධායකු වශයෙන් දැන්වීම් පුවරු, බිත්ති පුවත්පත් සඳහා චිත්‍ර නිර්මාණය කරමින් ද, ඒ සඳහා කවි, නිසඳැස් ලියමින් ද මාගේ ගී රචනා මංපෙතේ මුල් පියවර තැබුවෙමි. කවි ලිපි හුවමාරු කර ගනිමින් ගී රස වින්දනය වඩවාලූ කපිල ජනක් පාසල් මිත්‍රයා ද අමතක කළ නොහේ. "ආදී ආනන්දයීය 75 - 80" කණ්ඩායමේ සංස්කාරකවරයා වශයෙන් කරන ලද මාසික ප්‍රවෘත්ති ලිපි, සමරු කලාප මාගේ ලිවීමේ සහ ඇඳීමේ කුසලතාවයනට ධනාත්මක ප්‍රතිචාරයක් ලබාදීම මා ලද විශාල ධෛර්යයකි. එවකට නැවතී සිටි කිරුළපණ නිවසේ ජස්ටින් ජයසුන්දර ඥාති සොයුරාද හරවත් දේ සඳහා මා යොමු කරවූවෙකි.

මාගේ කුළුඳුල් ගී උපත පිළිබඳ ව සුභාරංචිය අසන්නට ලැබුණේ මා මුලින්ම ක්ෂේත්‍රයේ දැන හඳුනාගත් ශිල්පී සුනිල් එදිරිසිංහයන්ගෙනි. "ස-විචිත්‍ර" නිවසේ "සරසවි අසපුව" පටිගත කිරීම් නැරඹීමට ආරාධනා ලදුව එහි ගිය මා වික්ටර් රත්නායකයන්ට හා ප්‍රවීණ රචක ගීතනාත් කුඩලිගමයන්ට හඳුන්වා දෙන ලද්දේ "සුනිල් අයියා"මය. ඒ වනවිටක් මාගේ දෙවන පද රචනයටත් තනු යොදා සිටි රත්නායකයන් එතැන් පටන් මට "වික්ටර් අයියා" වීය. රෑ අඳුරේ "කුඩලි අයියාගේ" වාහනයේ කැසට් වාදන යන්ත්‍රයෙන් "හත් දා නවදා" ගීය අසන්නට ලැබුණු ඒ මොහොත කුළුදුල් දරුවාගේ මුහුණ දුටු මොහොත සේම වීය මා හට.

ගේය පද රචකයකු වශයෙන් මා ආ ගමනේ මුල් ම දෛවෝපගත සිදුවීම මා සයවන ශ්‍රේණියේ සිට බැඳුණ ශිල්පියාගේ හඬින්ම මගේ ඒ කුළුඳුල් ගීය එළිදැක්වීමයි. දෙවැන්න නම් මා වෘත්තකියකු වශයෙන් විවරණය ලද වේදිකාවේදීම රචකයකු වශයෙන් ද නියත විවරණ ලැබීමයි. පනස්වන නිදහස් ස්වර්ණ ජයන්තිය වෙනුවෙන් ජාතික රූපවාහිණිය සංවිධානය කළා වූ ආධුනික ගීත රචනා තරඟයෙන් තෝරා ගැනුණ "එක් ස්වරයක" පද පෙළ වෙනුවෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී සහතිකපත් තිළිණ ලද එම නිර්මාණ දායකත්වයෙන් අජිත් ජයවීරයන් නිෂ්පාදනය කළා වූ "නිදහස් ස්වර්ණ ජයන්ති සරසවි පෙරහැර" වැඩ සටහන වෙනුවෙන් නිදහස් චතුරස්‍රයේ දී මුලින් ම රූපවාහිනී කාච ගත කරනු ලැබුවෙමි. මා විමසූයේ නලින් කරුණාතිලකයි. එච්. එම්. ජයවර්ධනයන්ගේ තනුවට ගී ගැන්වූණේ කරුණාරත්න දිවුල්ගනේ ශිල්පියායි.

මා රසිකයන් අතර හඳුන්වා දුන් දෙපළ පිළිබඳ ව අමුතුවෙන් වැනිය යුතු නොවේ. "සිංග් ලංකා" සමාගම නිෂ්පාදනය කළ "මල්වරුසා" ගීතාවලිය සඳහා "මැද්දේගම් ගිය මද්දුමයා" සහ "හාද වෙන්ට ආව තමයි" පච රචනා ද්විත්වයක් ම සංගීතවත් කරමින් මියැසියේ හරඹ දැක් වූ රෝහණ වීරසිංහ සංගීතවේදියාණන් සහ සිය මියුරු හඬින් කැටයම් ගැන් වූ දීපිකා ප්‍රියදර්ශනී විශාරදවරිය සිහිපත් කරන්නේ හද බැඳි සෙනෙහසනි. සේනානායක වේරලියද්දයන්ගේ තනුවට ගැයුණ ශිල්පී ජානක වික්‍රමසිංහගේ "නුඹෙ සිරික්කියට" ගීතය ද රසික වින්දනය මෙන්ම විචාරක පන්හිඳ තුඩ ද අවුලවාලන්නට සමත් විණැයි මම හඟිමි. එසේ වුවද රත්නායකයන් ගැයූ "නැවුම් කන්‍යාලියක සේ මා" සහ වීරසිංහයන්ගේ තනුවකට අනුව ජානක ගැයූ "ඉසුරුමුණියක" නම් වූ භාවමය ගී සැඟ වී ගියේ කොහේ දැයි සොයන්නට අද ද මම වෙහෙසෙන්නෙමි. සිත කඩා වැටුණ අවස්ථා කීපයකදීම ක්ෂේත්‍රය පිළිබඳ ව මනා අවබෝධයක් ලබා දෙමින් මා හට දිරි දුන් කුලරත්න ආරියවංශ ජ්‍යෙෂ්ඨ ගේය පද රචකයාණන් මෙහිදී සිහිපත් කිරීම යුතුකමකි.

නිතර මාගේ නිර්මාණ ඇගයුවා වූ ද නිවැරදි කළාවූ ද රත්න ශ්‍රී විජේසිංහ ප්‍රවීණ කිවිදාණන් අද මා වෙනුවෙන් පෙරවදන් ලියන්නේ ය. එතුමාණන් විසින් රචිත වික්ටර් අයියා ගැයූ "පාත ඉඳන්" ගීතයේ අත්වැල් ගායනා අතර මාගේ හඬ ද මුහු වී ඇති වග මේ වනතුරුත් එතුමන් දන්නවාදැයි නො දනිමි.

"මැද්දේගම් ගිය" ගීය විචාරයට ලක්කරමින් මුලින් ම "ජනතා" පුවත්පතට ලිපියක් සම්පාදනය කළ ඉනෝකා සමරවික්‍රම මෙනෙවියට මා හඳුන්වා දෙනු ලැබුයේ අජන්තා රණසිංහ විසිනි. සැම කල්හිම සුහද පිළිසඳර අතරින් මා ඥාණනය කළා වූ ද මා උනන්දු කළා වූ ද මහාචාර්ය සුනිල් ආරියරත්න, ධර්මසිරි ගමගේ ප්‍රවීණයින් මෙන් ම "ගීත රචක සංසදය" ඇසුරෙහි වූ සියලුම ප්‍රවීණ නවක සහෘදයන් සිහි ගන්වන්නේ ලෙන්ගතුකමිනි.

විජේරාම මාවතේ සව්සිරිපායේ අවන්හලේ දී දැන හඳුනාගත් ලයනල් රන්වලයන් මාගේ ගී රචනා ආර මඳක් අන් අතකට යොමු කරවීමට මුල් වූ ඇදුරිඳු කෙනෙකු වී ය. ජන ගී ඇසුරින් නැගි තනුවක් මුව'ග රඳවාගෙන මා එවකට සේවය කරමින් සිටි සෙත්සිරිපායේ කාර්යාලයට පැමිණි අන්දමත්, මගේ මේසයට තට්ටු කරමින් එම තනුව මුවින් මුදාහළ අන්දමත් මගේ කාර්යාලයීය සගයින් අද ද සිහිපත් කරන්නේ සෙනෙහසිනි. බන්දුල විජේවීරයන් සමඟින් ගැයුණ "ඇහුවම කන් පිරෙනා" ගීයෙන් ඇරඹියේ තනුවට අනුව ප්‍රසාංගික ව ඉදිරිපත් කළ හැකි ප්‍රස්තුතයන්ට ගැමි බස් වහර යෙදීමෙන් සපිරෙන ගී නිර්මාණවලියකි. එය ඉතා අසීරු අභ්‍යාසයක් වුව ද, අපූරු අත්දැකීමක් ද වීය. ඒ ගැමි ගී වන්නම් බෙර පද අතරින් පිළිපන් හාසය හා උපහාසය කැටිකොට ගත් එතුමන්ගේ සිනාව නිසාම ය. විද්‍යාලයේ දී ගුරුවරයෙකු නොවුවද මේ සද්කාර්යයේ දී එතුමන් මා හට ගුරු මුෂ්ටියෙන් තොර වූ වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම ඇඳුරෙකු වී ය. ජාතික ඇඳුමින් මා සරසවා "ගම අවුලක්ඤක්ඤං" ප්‍රසංග වේදිකාවේ දී ප්‍රේක්ෂකයින්ට මා හඳුන්වා දුන්නේ ගීත රචකයෙකු වශයෙන් තමා ද රචකයින්ගේ වටිනාකම දැන සිටි නිසාවෙන් යයි හඟිමි. ගීත ක්ෂේත්‍රයේ මාගේ තෙවන දෛවෝපගත සිදුවීම නම් එතුමන් සිය අවසන් ගීය තමාගේ තනුවට පමණක් නොව අදහසට ද අනුව ලියවා ගැනීමයි. එය තමාගේ වියෝව ගැනම ලියවා ගත්තාදෝ යි විටෙක සිතේ. ම'පියාණන් ගේ වියෝවෙන් පසු මහා හඬින් ම මා හැඬැවූ වියෝවය එයයි. කලාභවනේ දී හා චිතකය දැල්වෙද්දී වාදනය වූ, "මගේ බුදු අප්පච්චියා" ගීයෙන් හැඬැවුණේ එතුමන්ගේ සිසු පිරිස පමණක් නොවේ. එක් ප්‍රසංගයකදී මා අතින් බිඳුණා වූ වටිනා පළඟාන වෙනුවෙන් රන්වලයන් වෙනුවෙන් ගී පළඟානක් පිළිගන්වන්නට ලැබීමත්, එයින් රස වළඳමින් සහන් රන්වල සොයුරා මතු පරපුර පෙළ ගැන්වවීමත් මා හට මහත් සතුටකි.

මාගේ පද රචනාවක් දායක කර ගත්තා වූ සැම සියලු නිර්මාපකයින්ට, ගායන ශිල්පී - ශිල්පිනියන්ට, මාධ්‍යයන්ට, හඬ පරිපාලකවරුන්ට සංගීත ශිල්පීන්ට, දර්ශන ගත කිරීමේ ශිල්පීන්ට, ශබ්දාගාර ශිල්පීන්ට කෘතවේදිත්වය පළ කරන්නට මෙහි ඉඩ ලබා ගන්නේ "ගීතය" යනු සාමූහික ප්‍රයත්නයක අග ඵලය බැව් අවබෝධ වූ නිසාවෙන් ම ය. පොතපත හා අගනා උපදෙසින් මා දැනුවත් කළා වූ ගුණදාස කපුගේ විශාරදවරයාගේ අභාවය සිහිපත් කරන්නේ සොවිනි. නිදහස් උත්සවයක් වෙනුවෙන් අවිස්සාවේල්ල පුස්තකාල ශාලාවේ දේශනයක් පැවැත්වීමට ජීවිතයේ ප්‍රථම වතාවට ආරාධනා ලද අවස්ථාවේ ජේ. ආර්. පී. සූරියප්පෙරුම විද්වතාණන් හඳුන්වා දෙමින් මා දිරිමත් හා සවිමත් කළ කපුගේ සොයුරාණන්ට මුණගැසී ස්තුති කිරීමට හදිසි වියෝවය නිසා වරම් නොලද්දෙමි. මාගේ නිර්මාණ ප්‍රතික්ෂේප කළා වූ සියල්ලන් වෙත ද මගේ ප්‍රණාමය හිමිවන්නේ වඩාත් සරු යමක් කිරීමට මා හට පන්නරය ලබා දුන්නේ ඔවුන් නිසාවෙනි.

ලේක්හවුස් ආයතනයේ ජ්‍යෙෂ්ඨ පුවත්පත් කලාවේදිනියක වන සාගරිකා දිසානායක (ජයසිංහ) නැගණිය මා මෙහිදී හද පිරි ස්නේහයෙන් ආවර්ජනය කරන්නේ මා ලියූ සිව්පදයක් හෝ සිය

පුවත්පතක පළ කිරීමට උනන්දු නොවූ බැවිනි. තනිව දෙපයින් නැගී සිටීමෙන් ලබන ආත්ම තෘප්තිය මා අද ලබන්නේ ඇයට පින්සිදුවන්නට නොවේ ද ? සියලු යටිතල පහසුකම් සහ ඔවදන් සපයමින් ද මගේ දේ විචාරය කරමින් ද ඇය මගේ නිර්මාණ දිවියේ සෙවනැල්ල වූවාය. "සිසිරගේ කුරුටු ගී" සිහිනයේ කතා නායිකාව ද ඇය ම යි. සංගීතාචාර්යවරියක වන විශාරද ගෝපිකා දිසානායක (ලියනගේ) බාල නැගණිය මා හට වඩාත් සමීප වූයේ වයලීනය හා බටනාලාව වැයීම ප්‍රගුණ කළ කුඩා කාලයේ දී ය. පිළිගැනීමේ ගීත, භක්ති ගීත ලියවා ගනිමින් සහ ස්වර සටහන් ලියවා ගනිමින් මා පැන් තුඩග මුවහත් කළ ඇය ඒවායේ තනු නිර්මාණය කරවා ගනිමින් මාගේ ස්වර මනස ද තියුණු කරවූවා ය. කුඩා කල සිට ම අප අතර රැඳෙමින් උපකාර කළා වූ "නන්දා අක්කා" අපගේ ඥාති සොයුරියට මාගේ තුති පිරි නැමීම ද යුතුකමකැයි සිතමි.

දාරක ස්නේහයෙන් මා සංවේදී කළා වූ සරිනි දියණියත් පියත් පුතණුවනුත් මා ලද දෙයින් නිරන්තරයෙන් ම උදම් වන්නෝ ය. "නිර්මාපකයකුගේ නිර්මාණයක් සිය දරුවකු හා සමානය" යන්න මා වටහා ගත්තේ ඔවුන් ගේ දැස් කියැවීමෙනි. ඔවුන් හදා වඩා ගනිමින් රකින මා යුග දිවියේ සෙවනැල්ල වන ප්‍රිය බිරිඳ පද්මා මාගේ පමාවන් ඉවසීම මා මෙහිදී ලබන ලොකුම සැනසීමයි. පෙම් පුරනා සමයේ දී මෙන්ම වර්තමානයේ දී ද ඇය මා හට බොහෝ මනෝභාවයන් ලබා දෙන්නී ය.

මෙල්බන් නුවර ලේඛකයකු බවට මා පත් කළ "පහන" සඟරාවට මා සම්බන්ධ කළා වූ ජගත් ජේ. එදිරිසිංහ සොයුරා පිළිබඳව ද යමක් ලිවිය යුතු වන්නේ ය. කලුනික වන් විරළ ගණයේ කලණ මිතුරෙකි හේ. පොතපත පළ කිරීමේ දී තමා ලද අත්දැකීමෙන් යුතුව නිතර මා දිරිමත් කළ ජගත් මෙම පොතේ කංචුක නිර්මාණයේ දී සිය පරිගණකය වෙහෙසවමින් මා හා එක් වීය. සඟරාවේ "සමවැදුම" ගීත විචාරාත්මක ලිපි සම්පාදනය සඳහා නිතර මා උනන්දු කරවන්නේ වරුණ සාවින්ද සොයුරායි. කැන්ගරුදේශය පුරා නොමිලයේ බෙදාහැරෙන "සන්නස" මාසිකය අපගේ නැවුම් ම උත්සාහයයි. ගී ලිවීමේ නොනිත් ආශාව මුදුන්පත් කරවීමට මෙරට ශිල්පීන් ම'වෙත ළං කරනා ඔවුනට පින් !

"සිසිරගේ කුරුටු ගී" එකතුව පළ කිරීමට තෝරාගත් විද්වතුන්ට ද, ඊට උර දුන් සිරිසුමන ගොඩගේ මැතිඳුන් ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට ද වේ වනවිට රටින් බැහැරව සිටින මාගේ අයැදුම්පත ලද මොහොතේ පටන් මා සම්බන්ධීකරණය කළා වූ අමිල තේනුවර මහත්මාට ද පෙරවදනින් මගේ ගී එකතුවේ හරස්කඩ හුවා දක්වන රත්න ශ්‍රී විජේසිංහයන්ට ද මෙයින් මගේ තුති පිරිනැමේ.

මතු පරපුර වෙනුවෙන් ද යමක් කිරීමට මගේ පද රැකුලක් වී නම් එයයි මා ලබනා සතුට. "සඳසාවි" ගීයෙන් රසිකයින් හඳුනාගත් විශාරද වසන්තා මධුරංගනී, මෙල්බර්න් නුවර ලලිත් අරුණ ශාන්ත වැනි ශිල්පී ශිල්පීන් දෙස බලා මා සතුටු වන්නේ බුලත් හුරුල්ලට අගනා ඔසුවලින් අසාධ්‍ය රෝගීන් සුවපත් කර ගොවිතැන් බතින් සිය දරුපවුල රකිමින් ජීවත් වූ මගේ පියාගේ පියාණන් එම රෝගීන් දෙස බලා සතුටු වූවාක් මෙනි. මා සොයා එන ගී ආතුරයින් සුවපත් කිරීමයි මාගේ ඒකායන ප්‍රාර්ථන ය.

**සිසිර දිසානායක**
මෙල්බර්න් නුවර දී
2005. 03. 11

"වීණා ශ්‍රී"
අවිස්සාවේල්ල.